(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(17).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 නොවැම්බර් 22 සෙනසුරාදා**

**2025 නොවැම්බර් 29 සෙනසුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 243 — වැඩසටහන 01 — † 2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන තිස් එක්දහස් පන්සියයක් (රු. 31,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **243** | - | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන** | **01** | - | මෙහෙයුම් වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 31,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 31,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 නොවැම්බර් 18 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 4 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 3 දක්වා එකතුව රු. 51,394,600,000

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පරිපූරක මුදල,— ශීර්ෂය 249 — වැඩසටහන 01 — † 2025 ජනවාරි 1 දිනෙන් ආරම්භ වන හා 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන දහඅට දහස් පන්සියයක් (රු. 18,500,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **249** | - | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන** | **01** | - | මෙහෙයුම් වැඩසටහන | |
| | | | මූලධන වියදම් | රු. 18,500,000,000 |
| | | | **මුළු වියදම** | **රු. 18,500,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

† 2025 නොවැම්බර් 18 දින ඉදිරිපත් කරන ලද 2025 අංක 5 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න.

පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 4 දක්වා එකතුව රු. 82,894,600,000

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2026 ජනවාරි 09 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 103/2025

ගරු රෝහණ බංඩාර මහතා,— පිහිනුම් කුසලතාවය ඉහළ දැමීමේ වැඩසටහනක් සකස් කිරීම,— දියෙහි ගිලී මිය යන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන බව මෑත කාලීනව නිරීක්ෂණය වන හෙයින්, ඉතා උසස් වාරි ශිෂ්ඨාචාරයකට හිමිකම් කියන අතීත ජනතාව තුළ පැවති පිහිනුම් කුසලතාවය, වත්මන් පරපුර තුළ ද ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

පා.104/2025

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කරමින් දැනට බලාත්මකව පවතින 2017 අංක 17 දරන පනතේ විධිවිධාන ප්‍රකාරව හඳුන්වා දෙන ලද 'මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය' ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කොට්ඨාස සීමා නිර්ණය ක්‍රියාවලිය මෙතෙක් අවසන් කර නොමැති බැවින් මේ වනවිට සියලු පළාත් සභා මහජන නියෝජිතයන්ගෙන් තොරව ක්‍රියාත්මකව පවතින හෙයින් ද;

මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යූහයේ හා නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත්, 2022 වර්ෂයේ නවවැනි පාර්ලිමේන්තුව විසින් පත්කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත මඟින් හඳුන්වා දෙන ලද 'මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය' එකී සංශෝධන පනතේ සඳහන් අනුපාතය අනුව අවශ්‍ය සීමා නිර්ණය සිදු කරමින් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙන සේ නීති කෙටුම්පත් කිරීම අවශ්‍ය බව සාකච්ඡා කරමින්, එලෙස එවැනි නීති කෙටුම්පත් සම්පාදනය කරන තෙක් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට හැකියාව සැලසෙන පරිදි යෝග්‍ය නීති පැනවීමට එහිදී නිර්දේශ කර තිබුණ ද, දහහත් දෙනෙකුගෙන් සංයුක්ත වූ එකී කාරක සභාවේ වාර්තාව සාමාජික මන්ත්‍රී අට දෙනෙකු පමණක් අත්සන් කර 2022 ජුනි 22 දින පාර්ලිමේන්තුවට පිළිගන්වන ලද හෙයින් ද;

2025 ජුනි 05 වැනි දින පාර්ලිමේන්තුවේ පළමුවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වන අමාත්‍යවරයාගේ වාර්තාව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2025.11.19 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද හෙයින් ද; සහ

පළාත් සභා ඡන්දය පැවැත්වීමට සුදුසු ඡන්ද ක්‍රමය පිළිබඳ විවිධත්වයෙන් යුත් අදහස් රාශියක් ඇති බැවින්ද, 2017 වර්ෂයෙන් පසු රටේ මැතිවරණ ක්‍රම පිළිබඳ සංවාදය වඩාත් පුළුල් හා ගැඹුරු වී ඇති බැවින් ද, කාන්තා නියෝජනය අනිවාර්ය කිරීම, තරුණ නියෝජනය, වියදම් සීමා, මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය, පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතිය සහ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය තහවුරු කිරීම ආදී ලෙස, ඡන්ද ක්‍රමයක් සකස් කිරීමට පුළුල් සංවාදයක් කළ යුතු හෙයින්;

පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

   (ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3. එම කාරක සභාවට —

   (අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

   (ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

   (ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

   (ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

   බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***